# ඉපැරණි ශ්‍රී ලංකාවේ විසූ බ්‍රාහ්මණයෝ
# (අභිලේඛන ඇසුරෙන්)

කුඩාවැවේ සෝමානන්ද හිමි

## හැඳින්වීම

පුරාතන ශ්‍රී ලාංකේය සමාජ, සංස්කෘතිය ආදී ක්ෂේත්‍රයන්හි ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී බ්‍රාහ්මණයන් විසූ බව පෙනීයයි. ඔවුහු ශ්‍රී ලාංකේය සංස්කෘතියටත්, පුද්ගල බද්ධ චින්තනය කෙරෙහි මෙන්ම සමාජ පදනම කෙරෙහිත් බලපෑම් ඇති කළ පිරිසක් වශයෙන් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරෙන් ඉස්මතු වෙති. මේ රටෙහි මුල්ම අවධියේත් ඉන්පසුවත් ඇතැම් පුරාතන ඉන්දීය බ්‍රාහ්මණ සංකල්ප ක්‍රියාත්මක විය. චතුර්වර්ණ සංකල්පය ක්‍රියාත්මක වී ඇති අයුරු ද දක්නට ලැබේ. භාරතයේ පැවැති චතුර්වර්ණ කුල ක්‍රමයට සමාන ආකාරයෙන් යුත් කුල සම්ප්‍රදායයක් ලෙස විශේෂයෙන් මුල් අවධියේ ලක්දිව පැවැති බව පැහැදිලිය. ඒ අනුව ප්‍රාග් බෞද්ධ යුගයේ මෙන්ම මහින්දාගමනයෙන් පසුවත් ශ්‍රී ලාංකේය සමාජ, සංස්කෘතික ක්ෂේත්‍රයන් තුළ බ්‍රාහ්මණයන් ක්‍රියා කළ බව අනාවරණය වේ.

## පර්යේෂණ ගැටලුව

පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජ සහ සංස්කෘතික තොරතුරු අනාවරණය කර ගැනීමට යොදාගත හැකි විවිධ ප්‍රාථමික මූලාශ්‍රය පාර්ශ්වයන් ඇත. ඒ අනුව, පුරාතන ශ්‍රී ලංකා සමාජ, සංස්කෘතික ආදී ක්ෂේත්‍රයන් තුළ බ්‍රාහ්මණයින් ක්‍රියා කළේ කෙසේද යන ගැටළුව ඔස්සේ මෙම පර්යේෂණය දියත් කොට ඇත.

## පර්යේෂණයේ අරමුණු

මෙම පර්යේෂණයේදී ප්‍රධාන අරමුණු කිහිපයක් ඔස්සේ කරුණු විමසනු ලැබේ. එනම්, පුරාතන ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මණයන් පිළිබඳව ඇති ඓතිහාසික තොරතුරුවල ස්වරූපය ගෙනහැරපෑම,

අභිලේඛනයන් තුළ බ්‍රාහ්මණයන් පිළිබඳව එන භාවිතය හඳුනාගැනීම මෙන්ම ඒ හා සම්බන්ධයෙන් පුරාතන ශ්‍රී ලාංකේය සමාජයෙහි දැකිය හැකි තොරතුරු ඉස්මතු කිරීම යන ඒවාය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් භාවිත ක්‍රමවේදය වන්නේ ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනයයි. එසේම සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වශයෙන් අභිලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රය ද සංසන්දනාත්මකව විමර්ශනයට ලක් කෙරේ.

**සාකච්ඡාව**

බුදුසමය ශ්‍රී ලංකාවට ලැබීමෙන් පසුව ද බ්‍රාහ්මණයන් මෙරට විසූ බවට ශිලා ලේඛනවලින් පැහැදිලි වේ. මොවුන් පිළිබඳව තොරතුරු අන්තර්ගත පැරණිම ශිලා ලේඛන ක්‍රි.පූ. 02 වැනි හා පළමුවැනි සියවස්වලට අයත් වේ. බ්‍රාහ්මණයන් පිළිබඳව තොරතුරු ඇතුළත් අභිලේඛනවල අක්ෂර පරීක්ෂා කළ නිකලස් එම අභිලේඛන ක්‍රි.පූ. දෙවැනි සහ පළමුවැනි සියවස්වලට අයත් යැයි සඳහන් කරයි.[1] එහෙත් හඟුරන්කෙත ධීරානන්ද හිමියන් පුරා අක්ෂර රටාවට අනුව ක්‍රි.පූ. තුන්වැනි සියවසටත් පළමුවැනි සියවසටත් අතර කාලයට අයත්වේයැ යි ගැනීම වඩාත් සාධාරණයැ යි පවසයි.[2] බ්‍රාහ්මණයන් පිළිබඳව තොරතුරු ඇතුළත් අභිලේඛන බොහෝමයක් පුරාණ ජනාවාස ආශ්‍රිතව පිහිටීම මත බ්‍රාහ්මණ වංශිකයන්ගේ පැතිරීමත්, ඔවුන් කෙතෙක්දුරට මෙරට සමාජයට අනුගතව සිටි පිරිසක් ද යන්න විමසීමටත් වැදගත් ය. එපමණක් නොව සමාජයේ ගුරුවරුන්, ආගමික පූජකයන් ලෙස දැක් වූ දායකත්වය විමසීමටත් ඉවහල් කරගත හැකි බව තවදුරටත් ධීරානන්ද හිමියෝ පවසති.[3]

මිහින්තලේ ලිපියක බ්‍රාහ්මණ පුත් වූ ''රෙතග'' නැමැත්තෙක්[4] පිළිබඳවත්,[5] සැස්සේරුව ලිපියක ''බමණවසකණ'' හා ''කසිකපුත'' පිළිබඳවත්[5] පිච්චන්දියාවෙන් ''වෙජ බමණ ගොබුතිය'' හා ''අචරිය ගොබුතිය'' පිළිබඳවත් තොරතුරු දැක් වේ.[6] හඳගල ලෙන් ලිපියක''දනුකය ගුතගේ'' පියා වූ ''පරුමක බමණ'' හා ''බමණ සුග'' පිළිබඳවත්[7] ''බමණ කොශික'' ගැන යාන්ගල ලෙන් ලිපියකත්[8]''බදන

බමණ තිස'' ගැන මහඇලගමුව ලෙන් ලිපියකත්[9] ''බමණ උතර'' පිළිබඳ රිටිගල ලිපියකත්[10] කන්දේගම කන්දෙන් ''බමණ උති''[11] ගැන මෙන්ම ''බමණ අති මතක'' පිළිබඳවත්[12] තොරතුරු ලැබේ. ''බමණ සුමණ'' ගැන මණ්ඩගලින්[13] ද ''බමණ වච'' පිළිබඳව සිතුල්පව්ව ලිපියක[14] ද දෙකුන්දරවැව ලිපියක''බමණ මරුකුත ගොතම''[15] ගැන ද මොලගෙ ාඩ ලිපියක''බමණ දතක''[16] ගැන සහ පොචනි රඣ සමග විවාහ වූ බ්‍රාහ්මණ දියණියක් පිළිබඳව බඹරගල ලිපියක ද සඳහන්ව තිබේ.[17] මේ හැර දඹුල්ලේ ලිපියක''පරුමක බමණ තිශ'' පිළිබඳවත්[18] ''බමණ මෙගලි'' පිළිබඳ දියබැට්ට විහාර ලිපියකත්[19] ''බමණ සීහ'' පිළිබඳව මිහින්තලේ[20] ලිපියකත් ධම්මගුත්ත තෙරුන්ගේ සොහෝයුරෙක් වූ බ්‍රාහ්මණයෙක් පිළිබඳව රණගිරිමඩින් ලැබුණු ලෙන් ලිපියකත්[21] සඳහන්ව තිබේ. ක්‍රි. ව. පළමුවැනි සියවසට පසුව ලියුවේයැ යි අනුමාන කරන කීරගල[22] දක්ඛිණගිරි විහාරය[23] යන ස්ථාන තුළින් ලැබුණු ලිපිවලින් ද බමුණන් සම්බන්ධයෙන් කරුණු ලැබේ. ධීරානන්ද හිමියන් අභිලේඛනයන්ගේ පැතිරීම පිළිබඳව සැලකිමේ දී පුරාතන ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශයන්හි බ්‍රාහ්මණයන් විසූ බවත් ඔවුනට සමාජයේ වැදගත් තැනක් හිමි වී පැවැති බවත් සිතිය හැකියැ යි පවසයි.[24]

මෙම අභිලේඛන විමසීමෙන් පෙනෙන විශේෂ කාරණයක් වන්නේ බමුණන් මෙරට භික්ෂූන්ගේ අනුග්‍රහයකයන් ලෙස ඉදිරිපත්ව ක්‍රියා කළ බවකි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සැස්සේරුව නම් ස්ථානයේ ලෙන් පූජා කළ අය අතර වාසකරණීගේ පුත්‍ර සෝමදේව නම් බ්‍රාහ්මණයා ද විය.[25] නිකවැරටිය ආසනයේ යාන්ලෙන නම් ස්ථානයේ සංඝයාට පිදූ ලෙනක කටාරමෙහි එය පිදු පුද්ගලයා හැටියට සඳහන් වන්නේ කොසිත නම් බමුණාගේ පුත්‍රයා වූ විජිතසණ නම් තැනැත්තාය.[26] මිහින්තලය සෙල්ලිපියේ ''(4)බමණ පුත (රෙ)තන ලෙණෙ සගස" ලෙස සඳහන් වේ.[27] සැසසේරුව හා යාන්ගල ලිපිවල (5)"බමණ වසකණි පුත සොමදෙවසචග..... හා (6) බමණ කසික පුත විජිත සෙනස ලෙණෙ'' යනුවෙන් පිළිවෙලින් සඳහන් වෙයි. පිච්චන්දියව[28] ඇති බ්‍රාහ්මණයන් පිළිබඳව සඳහන් පැරණිම ශිලා ලේඛන දෙකේ (7)''මහර(ජ)ස දෙවනපියහ අචරිය බමණ ගොබුතිය ලෙණෙ හා (8) මහරජස දෙවනපියස ගමිණි තිස වෙජ බමණ ගොබුතිස ලෙණෙ සගස" යනුවෙන් සඳහන් වෙයි. එහිම

තවත් ලිපියක ''බමණ පුසකපුතහ පුතසුගුතහ ලෙණෙ'' යනුවෙන් ද බඹරගල[29] ශිලාලේඛනයේ ''පොචනි රජ නගයහ ජය බමණ කොජ(4) ජිතය උපසික දතය ලෙණෙ'' යනුවෙන් ද සඳහන් වේ. දඹුල්ල, දියබත්ත[30] හා තෝරුව මයිලෑවේලෙන් ලිපිවල (11)''පරුමක බමණ තිසහ ලෙණෙ සගස දිනෙ.'' (12) '' සගස බමණ මෙගලි පුත පරුමක මජිම පුත දතහ ලෙණෙ'' (13) බමණග (ද) බොජිකෙ පරුමක සොණහ ලෙණෙ''යනුවෙන් සඳහන් වේ. හඳගල විහාරයේ[31] ශිලාලේඛන දෙකක සඳහන් වන්නේ මෙසේය. (14) "බමණ සුග පුත පුසදෙවස.... ලෙණෙ සගස''හා (15)"පරුමක බමණහ පුත දතකය ගුතහ ලෙණෙ (ලාංජනය) සගස'' යනුවෙනි. රුහුණේ ඇති සෙල්ලිපි ගණනාවක ද ඔවුන් පිළිබඳව තොරතුරු ඇතුලත්ය. (16) සිතුල්පව්ව, බමණ වච පුත... (ලෙ)ණෙ (17) කන්දෙගමකන්ද[32]''පරුමක බඩිහරමිත පුතපරුමක බමණ උතිය ලෙණෙ අගත අනගත චතුදිස සගස'' (18) කෝන්ගල''බමණ අතිමතකහ ලෙණෙඃ චතුදිස සගසඃ (18)මණ්ඩල,[33]''බමණ සුමහ ලෙණෙ සගස'' ආදී සෙල්ලිපි රාශියකම අන්තර්ගත තොරතුරු වන්නේ ගල් ලෙන් සඟසතු කර දීමයි. ඒවායේ දායකත්වය දරා තිබෙන්නේ බමුණන් ය.

අභිලේඛනයන්හි බ්‍රාහ්මණයන් සම්බන්ධයෙන් එන තොරතුරු මත කරුණු ගණනාවක් අනාවරණය කරගත හැක. ඒ අනුව බ්‍රාහ්මණයන් පිළිබඳව ස්ථාවරත්වය සම්බන්ධිත නිච්චිත තොරතුරු, ඔවුනගේ ඉතිහාසය එනම්, පූර්ව රාජ්‍ය සමය දක්වා දිවෙන බව මෙන්ම සමාජය තුල බ්‍රාහ්මණයන්ගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ද තොරතුරු අනාවරණය කරගත හැක.[34] මේ සම්බන්ධයෙන් ලක්දිව සාහිත්‍ය මූලාශ්‍රයවල[35] තොරතුරු අන්තර්ගත වුව ද එම සාහිත්‍ය මූලාශ්‍රය ලේඛනගත කාලය පසුකාලීන වන හෙයින් එහි විශ්වසනීයත්වය පිළිබඳ සැක මතු වුවද අභිලේඛන සමඟ ඒවා සසඳන විට එකී තොරතුරුවල ද අන්තර්ගත වැදගත්කම තවදුරටත් වර්ධනය වේ.[36]

බොහෝ සිංහල රජුන් භික්ෂූන්ට පමණක් නොව බ්‍රාහ්මණයන්ට ද අනුග්‍රහ දක්වා තිබේ. තුන්වැනි කස්සප රජු භික්ෂූන්ට මෙන්ම බ්‍රාහ්මණයන්ට ද ඔවුනොවුන්ගේ කටයුතු උදෙසා අනුග්‍රහ දක්වා තිබේ.[36] මෙම රජතුමාගේ රාජ්‍ය කාලයේ (724-730) දී භික්ෂූන්

මෙන්ම බ්‍රාහ්මණයන් ද ආගමික කණ්ඩායමක් ලෙස සලකා ඇති බව මහවංසයෙන් හෙළි වේ. තව ද තුන්වැනි කස්සප රජු තමන්ට ආවේණික ජීවන රටාවන් පවත්වාගෙන යාමට ගිහියන්ට, භික්ෂූන්ට මෙන්ම බ්‍රාහ්මණයන්ට ද ඉඩ සලසා දී තිබේ.[37]

ඉන් අනතුරුව දෙවන මිහිඳු රජතුමා[38] (777-797) ද බ්‍රාහ්මණයන්ට අනුග්‍රහ දක්වා තිබේ. සාහිත්‍ය මෙන්ම පුරාවිද්‍යාත්මක සාධක[39] රාශියක් අනුරාධපුර අවධියේ බ්‍රාහ්මණයන් පිළිබඳවත් හින්දු දේවාල පිළිබඳවත් අනාවරණය කරගත හැකිය. තව ද පළමුවැනි සේන සහ දෙවැනි සේන රජුන් ද බ්‍රාහ්මණයන්ට දක්වන ලද අනුග්‍රහ ද වංසකථාවල දක්නට ලැබේ.[40] මේ අයුරින් යම්කිසි ආකාරයකින් ක්‍රමයෙන් ක්‍රිස්තු වර්ෂාරම්භයත් සමග බ්‍රාහ්මණයන්ගේ බලය හීන වී ගිය ද ක්‍රි. ව. හත් වැනි සියවසින් පසු නැවැතත් බ්‍රාහ්මණයන්ගේ බලය ක්‍රමක්‍රමයෙන් වර්ධනය වන අයුරු පෙනෙයි. විශේෂයෙන් ම අනුරාධපුරට උතුරු දෙසින් තොටමුණු ආශ්‍රිත ප්‍රදේශයන්හි ද ද්‍රවිඩ ජනාවාස පැවැති බවක් පෙනෙයි.[41] ඉහත කී රජුන් දෙදෙනාගේ කාලයේ දී දකුණු ඉන්දියානු රාජ්‍ය සමග ලක්දිව රාජ්‍ය කිට්ටු සබඳතාවක් පැවැත්වීය. දෙවැනි සේන රජු භික්ෂූන්ටත් බ්‍රාහ්මණයන්ටත් දැක් වූ අනුග්‍රහය තුළින් තවදුරටත් මෙකී තොරතුරු ස්ඵුට වේ.[42]

මහින්දාගමනයට පෙර සිට බමුණෝ සමාජයේ වැදගත් තැනක් ඉසුලුවෝ ය. අභිලේඛනවල පරුමක, පඨකේ වැනි වදන් බ්‍රාහ්මණයන් සඳහා භාවිත කර තිබීමෙන් එය තවදුරටත් සනාථ කෙරේ.[43] එහෙත් භික්ෂූන් සමාජයට එල්ල කළ දැඩි බලපෑම නිසා මහින්දාගමනයත් සමග ම බ්‍රාහ්මණයන්ගේ එම තත්ත්වය බිඳ වැටිණි.[44] නමුත් ඔවුන් යළිත් ඒ හා සමාන තත්ත්තවයකට පත්වීමට පටන් ගත්තේ ක්‍රි.ව. හත්වැනි සියවසේ සිටය. මේ පිළිබඳව අදහස් දක්වන වල්පොල රාහුල හිමියන් ක්‍රි.ව. හත්වැනි සියවසට පෙරත් ඊට තරමක් පසුව වුවත් සමාජය තුළ භික්ෂූන්ගේ බලපෑම අභියෝගයෙන් තොර වූ බවක් පවසයි.[45]

අනුරාධපුර අවධිය අවසන් කරලීම උදෙසා එල්ලවුණු චෝළ ආක්‍රමණවලින් පසු ලක්දිව බ්‍රාහ්මණ බලය තවදුරටත් වර්ධනය විය. එහි ප්‍රතිඵලය වූයේ පොළොන්නරු අවධියෙහි මෙය වඩාත් ව්‍යාප්ත

වී යාමකි. මහාපරාක්‍රමබාහු[46] කල බමුණන් සිටි අතර මානාබරණ ද බමුණන්[47] හා සම්බන්ධව කටයුතු කර තිබේ. මෙකල බ්‍රාහ්මණයන් බෙහෙවින්ම සිටි බවට මූලාශ්‍රය මඟින් තවදුරටත් කරුණු සනාථ වේ.[48] මහාපරාක්‍රමබාහුගෙන් පසුව කල්‍යාණවතී රැජිණගේ කාලයේ වාසය කළ පරාක්‍රම සෙනෙවියා සිව් වර්ණය තුළ ගැටලු මතු[49] කළ බවත් කාලිංඝ මාඝ විසින් එය[50] නැවැතත් සංකීර්ණ කරන ලද බවත් මහාවංසයෙන් ප්‍රකට වේ.

දඹදෙණි අවධියේ විජයබාහු කළ ලක්ෂණවේදීන්[51] ගැන සඳහන්වන හෙයින් ඔවුන් බමුණන්ට විය හැක. දෙවැනි පරාක්‍රමබාහු රජු ද මනුනීතිය පිළිබඳ මනා වැටහීමකින් යුක්ත වූවෙකි.[52]

මින්පසු එන ගම්පොළ අවධිය තුළ ද බ්‍රාහ්මණ බලය බෙහෙවින්ම පැවැති අවධියක් ලෙස සැලකිය හැකිය. හින්දු කුල ක්‍රමය මෙරට පැවැති බව නන්දසේන මුදියන්සේ[53] පැවසුව ද එය මෙරටට ආවේණික වූ බව ඒ.එච්.එම්. එච්. අබයරත්න පවසයි.[54] එමෙන්ම සමාජයේ ඉහළම ස්ථානය බ්‍රාහ්මණයන්ට හිමි නොවූ අතර එය හිමිකර ගත්තේ ක්ෂත්‍රියයාමය.[55]

ගම්පොල අවධියයේ සිටි බමුණන් පිළිබඳව විවිධ අවස්ථාවල කරුණු දක්නට ලැබේ. ගඩලාදෙණි ලිපියේ සිව්වර්ණය ගැන සඳහන් වේ.[56] ඒ හැර 'සෙට්ඨී' යන පදය යෙදී ඇති අතර ඉන් වෛශ්‍යයන් හැඳින්වුවා ද නැතහොත් බමුණන් හැඳින්වුවා ද යන්න නිශ්චිත නොවේ. මක්නිසාද ඇතැම් සෙල්ලිපිවල 'බමුණු සෙට්ටිවරු' යනුවෙන් ඔවුන් විශේෂ කොට දක්වන ලද හෙයිනි. මින් පෙනෙන්නේ බමුණන් වාණිජ කටයුතුවල ද නිරත වී ඇති බවය. වීප්‍ර වංශයට හෙවත් බ්‍රාහ්මන වංශයට ජයමහලේ සිටාණන් අයත් වූ බව නියම්ගම්පාය ලිපියේ සඳහන් වෙයි.[57] 'සිටාණ' යන්න භාවිත වීමෙන් පෙනෙන්නේ ඔහු වානිජ කටයුතුවල නිරත වූ ධනවතෙකු වූ බවත්, සමාජයේ ප්‍රභූත්වයක් ද දේශපාලන බලයක් ද ඔහු සතුකරගත් බවත්ය. 'මන්ත්‍රීශ්වර' යන්න භාවිත කිරීමෙන් ඒ බව සනාථ වෙයි. අබයරත්න මුස්ලිම් ආක්‍රමණ නිසා භාරතයේ බ්‍රාහ්මණ පිරිස් ලක්දිවට පැමිණ මෙහි දී විවිධ වෘත්තීන්හි නිරත වෙන්නට ඇති බවට විශ්වාසය පළ කරයි.[58]

මැදවල ශිලාලේඛනයේ ද ගම්පොල යුගයේ විසූ බ්‍රාහ්මණයන් පිළිබඳ තොරතුරු එයි.[59] 'මඩිගය පවරාදෙන බමුණන්' යනුවෙන් එහි සඳහන් වන අතර ඉන් 'මඩිගය' හෙවත් රේගු ආදායම් බමුණන්ට පවරා ඇති බව පෙනෙයි. තුන්වැනි වික්‍රමබාහු රජුගේ කල මෙය සිදු වී ඇත.

තවද වීරබාහු ඈපා රාජ්‍යයට පත් වූ පසු බමුණන්ට ගම්, බිම් සහ කෙත්වතු ද වස්ත්‍රාභරණ, දැසිදස් මහිෂාදීන් මෙන්ම අශ්ව දාන, ගජදාන, ගෝදාන, රත්න දාන මෙන්ම කන්‍යා දානාදියෙන් සංග්‍රහ කළ බව නිකාය සංග්‍රහයේ[59] සඳහන් වේ. හත්ථවනගල්ල විහාර වංසය රචනා කළ අනවමදර්ශි හිමියන් ද බ්‍රාහ්මණ වංශයෙහි උපන්නෙකි.[60] මෙම තොරතුරුවලින් පෙනීයන්නේ බ්‍රාහ්මණයන් මුල් අවධියේ සිට ම බමුණන් මෙරට සිටි අතර ඔවුනට සමාජයේ වැදගත් තැනක් හිමි වූ බවක්ය.

**සමාලෝචනය**

ඉහත සඳහන් සාධක තුළින් පැහැදිලි වන්නේ ඉන්දියාවේ මෙන් බ්‍රාහ්මණ ඉගැන්වීම්වල එන චතුර්වර්ණය මෙන්ම එම සංකල්ප කිසියම් ආකාරයකට පුරාතන ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන බවයි. ප්‍රාග් බෞද්ධ ශ්‍රී ලාංකේය සමාජයේත් ඉන්පසුවත් ශ්‍රී ලාංකේය සමාජයේ කිසියම් අයුරකින් බ්‍රාහ්මණයන්ගේ ක්‍රියාකාරීත්වය පැවති බව අභිලේඛන ඇසුරෙන් පැහැදිලිව පෙනෙයි. එය තවදුරටත් සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයමය සාධක සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීම තුළින් සනාථ කරගත හැක.

**ආන්තික සටහන්**

1 C.W. Nicholas, "Text of the Brahmi Inscriptions in the Ruhuna National Park", UCR, Vol. VII, No. I, 1950, P. 260.

2 හගුරන්කෙත ධීරානන්ද හිමි, **රාජත්වය, රාජ්‍යය සහ ආගම**, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, 2004, පි. 153.

3 එම.

4 Inscription of Ceylon, (IC) Vol.I, part I, ed. S. Paranavitana, Colombo: Department of Archaeology, 1970, No. 67, P.S.

5 UCR, Vol.VII, 1950, P.261; IC, Vol.I, No.1003, P.78.

6 IC, Vol.I, No.1059, P. 81.

7 Ibid, No. 124, P.10, No.1136, P.90.

8 Ibid, No.205, P.17.

9 Ibid, No. 228, P.18.

10 Ibid, No. 242, P.19.

11 Ibid, No.296,P.23.

12 Ibid, No. 545, P. 42.

13 Ibid, No. 589, P. 45.

14 Ibid, No. 601, P. 46.

15 Ibid, No. 656, P. 49.

16 Ibid, No. 812, P. 62.

17 Ibid, No. 814, P. 63.

18 Ibid, No. 838, P. 65.

19 Ibid, No. 1045, P. 81.

20 Ibid, No. 1111, P. 87.

21 Ibid, No. 1194, P. 96.

22 AIC, P. 54.

23 Paranavitana, op.cit, Vol. XXI, No. 82, 1929, P. 327.

24 ධීරානන්ද හිමි, එම, පි. 155.

25 Paranavitana, op.cit, Vol. XXI, 1929, P.321.

26 JRAS, (CB); Vol. 31. P.322.

27 ලංකාවේ පුරාවිද්‍යා සමීක්ෂණ-වාර්ෂික වාර්තා (ල.පු.ස.වා.වා.) 1911-12.99 අංක 8.

28 ලංකාවේ පැරණි ශිලා ලේඛන, ඊ මුලර් (ල.පැ.ශි.ලේ.) 84.

29 ල.පු.ස.වා.වා. ,1935, 42 ඡේදය.

30 ල.පැ.ශි.ලේ. 48.

31 ල.පැ.ශි.ලේ. 96.

32 ලංකා පුරාවස්තු (ල.පු.) 111, 208, 209.

33 ල.පු.ස.වා.වා. 1934, 77 ඡේදය.

34 ධීරානන්ද හිමි, එම, පිටු. 155-156.

35 **ඌපූම**, පරි. 7. ගා. 44, පරි.8. ගා. 4, පරි. 10, ගා. 21, 32, 102, පරි. 11, ගා. 20, පරි. 12, ගා. 36, පරි. 15, ගා. 104, පරි.21, ගා. 60, පරි. 23, ගා. 24; Vamsatthappakasini, (vap.) Vol.I,II,ed. G.P. malalasekara, London, P.T.S, 1935, PP. 283-284, 302; සම්මොහවිනොදනී, සංස්. යගිරල පඤ්ඤානන්ද හිමි, කොළඹ: ත්‍රිපිටක මුද්‍රණාලය, 1932, පි. 315; **මහාබෝධිවංශය**, සංස්. පී. සාරානන්ද හිමි, කොළඹ: ශාස්ත්‍රාලෝක මුද්‍රණාලය, 1891, පිටු. 250, 284.

36 ධීරානන්ද හිමි, එම, පි. 156.

36 ඌපූම, පරි. 46. ගා. 23.

37 ''ගිහිනං චෙව භික්ඛූනං බ්‍රාහ්මණානංච බතතියො වත්තපසී සකාචාරෙ.'' Chuvhamsa, 48.23.

38 **ඌපූම**, පරි.47. ගාථා. 141, 142.

39 Hettiarachi, op.cit, pp. 212-215.

40 ඌපූම, පරි. 48. 6. 49. 65-67.

41 Hettiarachi,op.cit, pp. 17-18.

42 ''(සේන) තුන් නිකාය සංශෝදනය කළේය. එතුමා බ්‍රාහ්මණයින් දාහකට රන්තලි දාහක් මුතුවලින් පුරවා ඒ මතු වන මහාර්ඝ මාණික්‍යය බැගින් තබා පූජා කළේය. එසේම එතුමා මැණික් ඔබ්බවන ලද පා පුරවා ක්ෂීරපායාස පිදීයත රන්හු පිදීය. කළණ මිතුරකු මෙන් ඔවුනොවුන්ගේ සිත් සතන් පිනවන්නා වූ වස්ත්‍රාභරණයෙන් ඔවුන් සැතැප්වීයත ඔවුන් තුල චිත්ත ප්‍රබෝධය ජනිත කළේය.'' Chuvhamsa, 51, 64-68; cr. Trns; p.153.

43 CJSG; 2, P. 214, No. 674; P. 214, No. 672.

44 Ellawala, op.cit, PP. 17, 170.

45 W. Rahula, op.cit, 1956, PP. 93ff.

46 ඌපූම, පරි. 62. ගා. 28.

47 එම, 62. 31-33, 4, 45-46, 3.

48 එම, පරි.66. ගා. 132, 138ත 67. 29-31, 73. 32. 71.

49 "සංකිණ්ණං ව චතුබ්බණ්නං අසංකිණ්ණං විධාය සො ධම්මාධිකරණං සත්තං කාරයි කුසත්පීකො,'' "සංකර වූ චතුර්වර්ණය අසංකර කළ'' ඌපූම, පරි. 78,ගා. 41.

50 එම, 8. 76.

51 එම, පරි. 81,ගාථා. 68-70.

52 එම, පරි. 84, ගා. 1.

53 Art and Archi; P.114.

54 එ.එච්.එම්.එච්. අබයරත්න, ගම්පොළ යුගය, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, පි. 236.

55 **බුත්සරණ**, සංස්. වැලිවිටියේ සෝරත හිමි, කොළඹ : මහාබෝධි යන්ත්‍රාලය, 1931, පි. 118 ; මෙම ග්‍රන්ථයේම සඳහන් පරිදි විද්‍යාචක්‍රවර්ති නැමැති පඬිවරයා විසින් පොළොන්නරුව යුගයේ දී රචනා කරණ ලද්දකි.; එම, පි. 336.

56 'ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර දි උත්තමාධම ජනයන්. ප්‍රභාෂෝදය, පිටු. 188-189.

57 ''කීර්ති භාස්කර ...., ශ්‍රී මාන් විප්‍රවංසොදයාවලෙ ගෞගතං සාසනං සංස සතාපයංශු... තේජසින් භාස්කර වූ භාස්කර නම් පූර්වනාව ප්‍රසිද්ධ ජයමහලේ සිටාන මන්ත්‍රිශ්වරයන්....''

58 අබයරත්න, එම, පි. 237.

59 EZ; Vol V. Pt. III, PP. 463-466.

59 නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය, සංස්. බන්දුසේන ගුණසේකර,කොළඹ: ඇස්. ගොඩගේ සහ ප්‍රකාශන, 1984, පිටු. 23-24.

60 එළු අත්, I, පි. 252; හත්ථ. ගා. 3.